## අභියාචනා සහ විරෝධතා කැඳවීම

- සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය පිළිබඳ අයදුම්කරුවන්ගේ අභියාචනා සහ මහජනතාවගේ පැමිණිලි සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.
- අභියාචනා සහ පැමිණිලි මාර්ගගත ක්‍රමයට හෝ ඉල්ලුම්පත් ආකෘතියෙන් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

## අභියාචනා කමිටු නිරීක්ෂණ සහ අනුමැතිය

- දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත්කළ අභියාචනා කමිටු මගින් අභියාචනා සහ පැමිණිලි විමර්ශනය සහ විභාග කරනු ලැබේ.
- අභියාචනා සහ පැමිණිලි විභාග කිරීමෙන් පසු සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය අභියාචනා කමිටු මගින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

## ප්‍රතිලාභ දීමනා ගෙවීම

- සුබසාධක දීමනා සඳහා සුදුසුකම් ලැබූ අවසන් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය සඳහා, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙනු ලැබේ.
- ප්‍රතිලාභ ගෙවීම් ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම තැන්පත් කරනු ලැබේ.



මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக்
கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilization and
National Policies

වැඩි විස්තර සඳහා


සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
පළමු මහල,
නව ගොඩනැගිල්ල
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති
අමාත්‍යාංශය
කොළඹ 01.

දුරකථන අංකය 0112484600 Ext. 4117
ෆැක්ස් අංකය 0112151405
විද්‍යුත් තැපැල **welfarebenefitboard2016@gmail.com**
**info@iwms.wbb.gov.lk**



**Printed at the State Printing Corporation**


Welfare Benefits Board
WBB Sri Lanka
INDEED FOR IN NEED

# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

## සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

- 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනත අනුව සියලු රාජ්‍ය සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීමේ කාර්යභාරය සඳහා ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනය වේ.
- සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සභාපතිවරයා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය වේ. පනත අනුව සභාපතිවරයා කොමසාරිස් වශයෙන්ද ක්‍රියාකරයි.
- සියලු දිස්ත්‍රික් ලේකම්වරුන් අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් ලෙසත්, සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් ලෙසත් පත්කර ඇත.
- සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කර පවත්වාගෙන යාම සඳහා යෝජනා ක්‍රම සකස් කර ක්‍රියාත්මක කිරීමත්, ඊට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමත් ප්‍රධාන කාර්යභාරය වේ.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය සමඟ කටයුතු කිරීමට, අයදුම්කරුවන් සහ ප්‍රතිලාභීන් සමඟ සම්බන්ධීකරණයට සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකයක් පිහිටුවා ඇත.

## සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය
## Social Registry Information System

- සමාජ ආරක්ෂණය සහ සුබසාධනය ලැබිය යුතු තැනැත්තන් හෝ පවුල් හඳුනාගතහැකි, සුබසාධක ප්‍රතිලාභ සඳහා තෝරාගැනීමේ නිර්ණායක මත සුදුසුකම් ගණනය කළ හැකි, ප්‍රතිලාභ ගෙවීම් සෘජුවම බැංකු ගිණුම් වෙත යැවිය හැකි සහ ප්‍රතිලාභින්ගේ සමාජ ආර්ථික තත්වය නිරීක්ෂණය කළ හැකි, ඒකීය තොරතුරු පද්ධතියකි.
- රජයේ විවිධ ආයතන මඟින් ක්‍රියාත්මක කරන බහුවිධ සුබසාධක, සමාජ ආරක්ෂණ වැඩසටහන් සහ යෝජනාක්‍රම එක් පද්ධතියකට සම්බන්ධීකරණය කිරීමේ හැකියාව මෙම තොරතුරු පද්ධතියට ඇත.
- නිවැරදිතාවය සහ විනිවිදභාවය ආරක්ෂා කළ හැකි ලෙස අයදුම්කරුවන්ගේ සහ ප්‍රතිලාභීන්ගේ තොරතුරු එක්රැස් කිරීමට සහ යාවත්කාලීන කිරීමට වෙබ් අඩවි සහ ජංගම යෙදුම් **(Web and Mobile Applications)** මගින් අඛණ්ඩව (ඉලෙක්ට්‍රොනිකව) සිදුකිරීමේ හැකියාව ඇත.
- හදිසි ආපදා ආර්ථික හෝ සමාජීය කම්පන, අර්බුද වලදී සමාජ ආරක්ෂණය සහ හදිසි සහන ලබාදිය යුතු පිරිස් ක්ෂණිකව, නිවැරදිව ඉලක්කගත ලෙස හඳුනාගැනීමට තොරතුරු පද්ධතියට හැකියාව ඇත.
- සමාජ සේවා සහ සුබසාධනය වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය නොවන ආයතන හෝ පුද්ගලයන්ට තොරතුරු පද්ධතියට සම්බන්ධ වීමට හැකියාව ඇති අතර ඒ තුළින් සමාජ ආරක්ෂණය ලැබිය යුතු ජන කොටස් නිවැරදිව හඳුනාගත හැක.
- අයදුම්කරුවන්ට හෝ ප්‍රතිලාභීන්ට තමා විසින් ලබාදුන් තොරතුරු නැවත නිරීක්ෂණය කළ හැකි වීම සහ කාලීනව සිදුවන වෙනස්වීම් අනුව වෙනස්වන තොරතුරු අඛණ්ඩව පද්ධතියට ඇතුළත් කිරීමේ හැකියාව ඇත.
- සුබසාධන සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජයට වැයවෙන පරිපාලන වියදම් අවමකර ගැනීමටත්, ප්‍රතිලාභ දීමනා ගෙවීම් ද්විගණනය වීම වළක්වා ගැනීමට පද්ධතිය සහය වේ.

## වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය

### වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවීම

- සුබසාධක ප්‍රතිලාභ බලාපොරොත්තු වන අයදුම්කරුවන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩල නිවේදනය අනුව තම අයදුම්පත මාර්ගගතව හෝ ආකෘති පත්‍ර මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

### ක්ෂේත්‍ර තොරතුරු සංගණනය

- සියලුම අයදුම්පත් සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතියට ඇතුළත් කරන අතර සියලුම අයදුම්කරුවන්ට **QR** කේතයක් සහ **HH** අංකයක් පද්ධතිය මඟින් සම්පාදනය කෙරේ.
- **QR** කේත හිමි සියලුම අයදුම්කරුවන්ගේ නිවාස වෙත, සංගණන නිලධාරියකු ගොස් වැඩි දුර තොරතුරු ලබා ගැනීම සහ නිරීක්ෂණය කරනු ලැබේ.
- ජංගම යෙදුම් මෘදුකාංගයක් මගින් ක්ෂේත්‍ර තොරතුරු සංගණනය කරනු ලැබේ.

### තේරීම් කමිටු නිරීක්ෂණය සහ අනුමැතිය

- ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින්, අයදුම්කරුවන්ගේ තොරතුරු නිරීක්ෂණය කිරීම සහ තෝරා ගැනීමේ නිර්ණායක ගණනය කිරීමට තේරීම් කමිටුව මඟින් අනුමැතිය ලබාදේ.
- තෝරා ගැනීමේ නිර්ණායක සහ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව සංගණනයට ලක් වූ සියලු අයදුම්කරුවන්ට පද්ධතිය මඟින් ලකුණු ලැබේ.

### සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම

- සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ මණ්ඩල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ලැබේ.